


P.L. එමාෂා ෂයිනි ජයසිංහ

# සිරිමලීට අලුත් සාමාජිකයෙක්


| | | |
|---|---|---|
| ප්‍රථම මුද්‍රණය | : | **2025** |
| නම | : | P.L. **එමාෂා ෂයිනි ජයසිංහ** |
| චිත්‍ර සහ කථාව | : | P.L. **එමාෂා ෂයිනි ජයසිංහ** |
| වෙනත් කෘති | : | **ඩෝරා පුංචි බෝනික්කා**<br>(ISBN - **978-624-206-766-1**) |
| ලිපිනය | : | **නො. 29, ගාල්කොන, හොඩියාදෙණිය** |
| පාසල | : | **මහ/මහමායා බාලිකා විද්‍යාලය**<br>**මහනුවර** |
| ඉගෙනුම ලබන පන්තිය | : | **2 - C** |
| කෘතිය පල කල දිනය | : | **2025/02** |
| ISBN | : | **978-624-208-404-6** |

# පිදුම

**රසවින්දනයෙන්, දැනුමෙන් පිරිපුන්**

**සියලු පාඨකයන් වෙත මෙම**

**කෘතිය ඉතා ආදරයෙන්**

**පුදන්නෙමි !**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

"අම්මේ, අද හරි මහන්සි දවසක් පයින් ඇවිල්ලා." අම්මාගේ මැසිවිලි හඬ ඇසෙයි. මේ වගේ හැමදාම අපේ ගෙදර මැසිවිලි නඟන හඬ ඇසෙන වාර දක්නට තිබුණි.

මම සිරිමලී, මේ මගේ කතාව. මගේ ගෙදර තිබුණේ නගරේ සිට බොහෝ දුර ඇති ලස්සන ගමකයි. අපේ පාරේ බස් තිබුණේ කලාතුරකින්. බොහෝ දෙනා ගමන් කරේ පයින්. සමහර අය කුලී රථයක් ගෙන ගමන් කරා. අපිත් එලෙසින් අපේ ගමන් කටයුතු සිදු කර ගත්තා.

පාසල් ගියේ, අනිත් ගමන් ගියෙත් ඒයාකාරයෙන්.

මෙලෙස හැමදාම ගෙවී ගියා. අපිටත් වාහනයක් තිබුණා නම්. කොතරම් හොඳදැයි නිතරම සිතුණා.



අම්මා, අයියා සහ මමත් ගෙදරට අළුත් වාහනයක් ගන්න එකට කැමැත්තෙන් සිටියේ හීන දැක්කා.

තාත්තාට නිතරම වාහනයක් ගන්න කියා ඇවටිලි කරා.



අනිත් අය වාහන වල යන විට මගේ හිතේ දුකක් ඇති වුණා. අපට වාහනයක් නැති එක ගැන කාලය ගත වුණා. වාහනයක් ඕමනායැයි මැසිවලි වැඩි වුණා.

තාත්තා දවසක් මෙහෙම කිවා. ''අයියා ශිෂ්‍යත්ව විභාගය පාස්වුනොත් වාහනයක් ගන්නවා.''

තාත්තා පොරොන්දු වුණා. මෙය ගෙදර හැමෝටම සුභ ආරංචියක් වුණා.

අයියා විභාගය සඳහා හොඳින් පාඩම් වැඩ කරා, මාත් අයියා වගේම පාඩම් වැඩ හොඳින් කරා. කාලය ගෙවුණා. විභාගය ලියන දිනය ළං වුණා. අයියා විභාගය හොඳින් ලිව්වා.



විභාග ප්‍රථිපල එන දවස ළඟටම ආවා. විභාග ප්‍රථිපලත් නිකුත් වුණා. අයියා හොඳින් විභාගය සමත් වෙලා ගෙදර හැමෝටම සතුටුයි.

අපි කවුරුත් බලන් සිටියේ තාත්තාගේ පොරොන්දුව ඉටු වෙන්නෙ කවදාද කියා දින ගනිමින්. එක දවසක් වාහනයක හඬක් අපේ මිදුල දෙසට එන බව ඇසුණා. අපි හැමෝම මිදුල පැත්තට දිව ගියා. සියළු දෙනා පුදුම කරවමින් තාත්තා අළුතෙන් වාහනයක් ගෙනත් තිබුණා.

එයා තමයි දැන් අපේ ගෙදර අලුත් සාමාජිකයා. අපිව ගමන් එක්ක යන්න ආව අලුත් කෙනා තමයි අපේ වීල් පොඩ්ඩා.



# ආදර්ශය

තමන්ට දෙයක් ලබා ගැනීමට ඕනෑ නම්, ඒ ගැනම හීන දකින්න. එය ලබා ගැනීමට උනන්දුවෙන් උත්සහ කරන්න.

# ස්තූතිය.....!

ග්‍රන්ථ කරණය සිදුකිරීමට මග පෙන්වූ ඒ
පිළිබඳව ඇල්මක් ඇති කළ සහ එය
සාර්ථකව සිදුකිරීමට දිරි ගැන්වූ
සෙනවිරත්න ගුරු පියාණන් හට හා
සමන්මලී ගුරුමෑණියන් හටත්,
මාගේ පන්තිභාර වාසනා ගුරුමෑණියන්
හටත්, සැම විටම මාගේ සෙවනැල්ල සේ
සිටින මාගේ ආදර දෙමාපියන් හටත්,
මට දිරියක් වූ සියලු දෙනාටත් මාගේ
ස්තූතිය මෙසේ පුදකරමි...

මෙයට,

මහමායා දියණිය එමාෂා

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට අල්බක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්නයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තරබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,  
සෙනෙවිරත්න මහලේකම්.